www.agaram.lk

55343

OL/2016/81/S-I, II (NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

81 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

| | | |
|---|---|---|
| කෘෂි හා ආහාර තාක්ෂණය | I, II | පැය තුනයි |
| விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் | I, II | மூன்று மணித்தியாலம் |
| Agriculture and Food Technology | I, II | Three hours |

## කෘෂි හා ආහාර තාක්ෂණය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ** (X) **ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ දියුණුව සඳහා ඉටු කරන ලද විශිෂ්ට සේවාව හේතුවෙන් 'මින්නේරි දෙවියන්' ලෙස දේවත්වයෙන් පුදනු ලැබූ රජතුමා වනුයේ,

(1) පරාක්‍රමබාහු රජතුමා ය. (2) වසභ රජතුමා ය.
(3) මහසෙන් රජතුමා ය. (4) අග්බෝ රජතුමා ය.

**2.** වාර්ෂික වර්ෂාපතනය හා උච්චත්වය පදනම් කරගෙන ශ්‍රී ලංකාව විවිධ කෘෂි දේශගුණික කලාපවලට බෙදා ඇත. ඒ අනුව මිලිමීටර 2 500ට වැඩි වාර්ෂික වර්ෂාපතනයක් සහ මීටර 900ට වැඩි උච්චත්වයක් සහිත කෘෂි දේශගුණික කලාපය හඳුන්වනුයේ,

(1) පහතරට තෙත් කලාපය ලෙස ය. (2) උඩරට තෙත් කලාපය ලෙස ය.
(3) පහතරට අතරමැදි කලාපය ලෙස ය. (4) මැදරට තෙත් කලාපය ලෙස ය.

**3.** කාලගුණික පරාමිති පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - සාපේක්ෂ ආර්ද්‍රතාව ප්‍රතිශතයක් ලෙස දක්වනු ලැබේ.
B - සුළඟේ වේගය පැයට කිලෝමීටරවලින් මනිනු ලැබේ.
C - ආලෝක තීව්‍රතාව ලක්ස්වලින් මනිනු ලැබේ.

මෙයින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.

**4.** පස් නියැදි හතරක පාංශු සංඝටකවල සාපේක්ෂ ප්‍රතිශත පහත වගුවෙහි දක්වා ඇත.

| | ජලය (%) | වාතය (%) | ඛනිජ (%) | කාබනික ද්‍රව්‍ය (%) |
|---|---|---|---|---|
| A | 45 | 5 | 25 | 25 |
| B | 25 | 25 | 45 | 05 |
| C | 05 | 45 | 25 | 25 |
| D | 25 | 05 | 25 | 45 |

මේවායින් බෝග වගාව සඳහා වඩාත් සුදුසු පස් නියැදිය වනුයේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**5.** වැහි බිංදු පොළොවට පතිත වීම නිසා පස් අංශු එකිනෙකින් වෙන්වී විසිරීම විසිරි ඛාදනය නම් වේ. මෙලෙස පස් අංශු වෙන් වීම අවම කළ හැක්කේ,

(1) සමෝච්ඡ රේඛා අනුව සී සෑමෙනි. (2) හෙල්මලු සැකසීමෙනි.
(3) පස වසුන් කිරීමෙනි. (4) සෝල්ට් (SALT) වැටි යෙදීමෙනි.

**6.** එක්තරා වගා බිමකින් ගත් පස් සාම්පලයක් යන්තමින් තෙත්කර දෙඅත්ල මැද තබා ගුලියක් සෑදීමට උත්සාහ කළ විට එය අසාර්ථක විය. මෙම නිරීක්ෂණයට අනුව මෙය,

(1) වැලි පසකි. (2) මැටි පසකි. (3) මැටි ලෝම පසකි. (4) වැලි ලෝම පසකි.

[දෙවැනි පිටුව බලන්න.

agaram.lk
Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !

www.agaram.lk



Agaram.lk - Keep your dreams alive !

**7.** යම් පසක බෝග වර්ධනය ප්‍රශස්තව සිදු වීම සඳහා එම පසෙහි පැවතිය යුතු තෙතමන මට්ටම පිළිබඳව නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) සංතෘප්තව පැවතිය යුතු ය.
(2) ක්ෂේත්‍ර ධාරිතාවේ පැවතිය යුතු ය.
(3) සංතෘප්ත අවස්ථාවත් ක්ෂේත්‍ර ධාරිතාවත් අතර පැවතිය යුතු ය.
(4) ක්ෂේත්‍ර ධාරිතාවත් මැලවීමේ අංකයත් අතර පැවතිය යුතු ය.


**8.** පාංශු කැටායන හුවමාරු ධාරිතාව රඳා පවතින්නේ එම පසෙහි ඇති
(1) වැලි හා රොන්මඩ ප්‍රමාණය මත ය. (2) වැලි හා බොරලු ප්‍රමාණය මත ය.
(3) හියුමස් හා රොන්මඩ ප්‍රමාණය මත ය. (4) මැටි හා හියුමස් ප්‍රමාණය මත ය.

**9.** විද්‍යාත්මක බෝග වර්ගීකරණයට අනුව ඇරිකේසියේ කුලයට අයත් බෝගයක් වනුයේ,
(1) අඹ ය. (2) ඉඟුරු ය. (3) රබර් ය. (4) පොල් ය.

**10.** වී බෝගයේ උද්භිද විද්‍යාත්මක නාමය නිවැරදිව සඳහන් කරනුයේ,
(1) *Oryza sativa* L. ලෙස ය. (2) *Oryza sativa* ලෙස ය.
(3) Oryza sativa L. ලෙස ය. (4) Oryza sativa ලෙස ය.

**11.** පහත දැක්වෙන ක්‍රියාකාරකම් අතරින් අතුරුයත් ගැමට අයත්වන ක්‍රියාකාරකම් වනුයේ,
(1) පස් පිඩලි කැපීම හා පෙරළීම ය.
(2) කැට පොඩි කිරීම හා සමතලා කිරීම ය.
(3) වගා වළවල් කැපීම හා පාත්ති සැකසීම ය.
(4) පැළ අවට පස් බුරුල් කිරීම හා පැළ මුලට පස් එකතු කිරීම ය.

**12.** පහත ABCD රූප සටහනෙන් දැක්වෙන්නේ පිළිස්සීමෙන් පස ජීවානුහරණය කිරීම සඳහා පිදුරු හා දහයියා තට්ටු වශයෙන් අතුරන ලද තවාන් පාත්තියකි. ඊතලවලින් දැක්වෙන්නේ සුළගේ දිශාවයි.




වඩාත් හොඳින් ජීවානුහරණය කිරීම පිණිස ගිනි තැබීම ආරම්භ කළ යුත්තේ තවාන් පාත්තියේ,
(1) AB පැත්තෙනි. (2) AD පැත්තෙනි. (3) BC පැත්තෙනි. (4) DC පැත්තෙනි.

**13.** පහත දැක්වෙන ජල සම්පාදන ක්‍රම අතරින් වැඩි ම ජල ප්‍රමාණයක් අවශ්‍ය වන ක්‍රමය වනුයේ,
(1) ඇලි ජල සම්පාදනයයි. (2) පිටාර ජල සම්පාදනයයි.
(3) බේසම් ජල සම්පාදනයයි. (4) ඉසින ජල සම්පාදනයයි.

● අංක **14** සහ **15** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් පාදක කර ගන්න.

A - පසට වසුන් යෙදීම
B - පසට රසායනික පොහොර මිශ්‍ර කිරීම
C - වගා භූමියේ කාණු කපා ගල් අතුරා වසා දැමීම
D - වල් පැළෑටි ඉවත් කිරීම

**14.** පාංශු ජල සංරක්ෂණ ක්‍රම ලෙස යොදා ගත හැක්කේ,
(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) B හා C පමණි. (4) C හා D පමණි.

**15.** ජලවහනය සඳහා යොදාගත හැකි ක්‍රියාකාරකමක් වනුයේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**16.** පහත සඳහන් ද්‍රව්‍ය අතරින් ගුණාත්මක බවින් ඉහළ, කොළ පොහොර ලෙස භාවිත කිරීමට වඩාත් සුදුසු ද්‍රව්‍යයක් වනුයේ,
(1) වියළී බිමට වැටෙන ශාක පත්‍ර ය. (2) හොඳින් මේරූ අමු ශාක පත්‍ර ය.
(3) ළපටි ඉපිල් ඉපිල් පත්‍ර ය. (4) අඩක් මේරූ ග්ලිරිසීඩියා පත්‍ර ය.

**17.** රතු දුඹුරු පැහැයෙන් යුක්ත, ස්ඵටික ලෙස පවතින, ජලයේ හොඳින් දිය වන රසායනික පොහොරකි,
(1) යූරියා. (2) ට්‍රිපල් සුපර් පොස්පේට්.
(3) මියුරියේට් ඔෆ් පොටෑෂ්. (4) රොක් පොස්පේට්.

**18.** ශාක පෝෂණය සඳහා අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර පෝෂක පමණක් අඩංගු වරණය කුමක් ද?
(1) සින්ක්, කොපර්, නයිට්‍රජන් හා කැල්සියම් (2) මැග්නීසියම්, පොටෑසියම්, කැල්සියම් හා සල්ෆර්
(3) කොපර්, බෝරෝන්, නයිට්‍රජන් හා පොස්පරස් (4) සින්ක්, කොපර්, මැංගනීස් හා බෝරෝන්

agaram.lk

[ තුන්වැනි පිටුව බලන්න.

www.agaram.lk



**19.** ගොඩබිම වැවෙන පළල් පත්‍ර වල් පැළෑටිය මින් කුමක් ද?

(1) කලාඳුරු (2) කුඩමැට්ට (3) දිය සියඹලා (4) මොනර කුඩුම්බිය

**20.** බෝගවලට වැළඳෙන පිටිපුස් රෝගය හා මලකඩ රෝගය සඳහා හේතුකාරක වන ජීවී කාණ්ඩය කුමක් ද?

(1) බැක්ටීරියා (2) දිලීර (3) වයිරස (4) ෆයිටොප්ලාස්මා

**21.** කුකර්බිටේසියේ කුලයේ බෝගවල පත්‍ර හා මුල්වලට හානි පමුණුවන පූර්ණ රූපාන්තරණය සහිත කෘමි පළිබෝධකයකු වනුයේ,

(1) ඉල් මැස්සා ය. (2) කුඩිත්තා ය.
(3) අවුලකපෝරා ය. (4) එපිලැක්නා ය.


**22.** කෘමි පළිබෝධ පාලනයේ දී වැදගත් වන ස්වාභාවික සතුරන් පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) බත්කූරා, දිමියා හා පිටි මකුණා (2) පැළමැක්කා, වන්දා හා මකුළුවා
(3) දිමියා, මකුළුවා හා වන්දා (4) ලේඩිබර්ඩ්, සුදු මැස්සා හා කුඩිත්තා

**23.** සහතික කරන ලද බිත්තර වී බීජවල තිබිය යුතු ප්‍රරෝහණ ප්‍රතිශතය අවම වශයෙන්,

(1) 85% කි. (2) 90% කි. (3) 95% කි. (4) 99% කි.

**24.** පහත **X** හා **Y** රූප සටහන්වලින් දක්වා ඇත්තේ බීජ ප්‍රරෝහණ ආකාර දෙකකි.




| | X | Y |
|---|---|---|
| A | බඩඉරිඟු | කඩල |
| B | වී | වම්බටු |
| C | බෝංචි | කඩල |
| D | මුං | මිරිස් |

ඉහත **X** හා **Y** රූප සටහන්වලට අදාළ බීජ ප්‍රරෝහණ ආකාර සඳහා නිදසුන් නිවැරදිව දක්වා ඇති පේළිය වනුයේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**25.** බීජාවරණයෙහි වර්ධක නිෂේධක අඩංගු වීම නිසා ප්‍රරෝහණය ප්‍රමාද වන බීජ වර්ගයක් වනුයේ,

(1) අඹ ය. (2) සියඹලා ය. (3) පැපොල් ය. (4) බඩඉරිඟු ය.

**26.** බිගෝනියා, පෙපරෝමියා හා සැන්සවේරියා ආදී විසිතුරු පත්‍රික ශාක ප්‍රචාරණය සඳහා වඩාත් ම සුදුසු ක්‍රමය මින් කුමක් ද?

(1) දඬු කැබලි සිටුවීම (2) මුල් කැබලි සිටුවීම
(3) පත්‍ර කැබලි සිටුවීම (4) අතු බැඳීම

**27.** කුඤ්ඤ බද්ධයක් සිදු කිරීමෙන් පසුව අනුජය පොලිතින් කවරයකින් ආවරණය කරනු ලබන්නේ,

(1) කෘමි හානි පාලනය සඳහා ය. (2) රෝග පාලනය සඳහා ය.
(3) උත්ස්වේදනය පාලනය සඳහා ය. (4) සුළඟට කැඩීයාම පාලනය සඳහා ය.

**28.** අංකුර බද්ධයක් සඳහා ග්‍රාහකයේ T හැඩැති කැපුමක් යොදන විට, එයට සවි කිරීමට සුදුසු අනුජයේ හැඩය මින් කුමක් ද?

(1)  (2)  (3)  (4) 

**29.** පාලිත තත්ත්ව යටතේ බෝග වගාවේ දී යොදා ගන්නා ස්ථිර ආරක්ෂිත වගා ව්‍යුහයක් වනුයේ,

(1) පාත්ති ආවරණ ය. (2) පේළි ආවරණ ය.
(3) සරල සූර්ය ප්‍රචාරක ය. (4) දැල් ගෘහ ය.

**30.** වායුගෝලීය තත්ත්ව සමග සංසන්දනය කිරීමේ දී සරල සූර්ය ප්‍රචාරකයක් තුළ

(1) උෂ්ණත්වය හා ආලෝකය අඩු ය.
(2) සාපේක්ෂ ආර්ද්‍රතාව හා උෂ්ණත්වය වැඩි ය.
(3) සාපේක්ෂ ආර්ද්‍රතාව අඩු අතර උෂ්ණත්වය වැඩි ය.
(4) සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩි අතර උෂ්ණත්වය අඩු ය.

**31.** සමෝධානිත ගොවිතැන පිළිබඳව නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) කුඩා ඉඩම් සඳහා සුදුසු ක්‍රමයකි. (2) මූලික වියදම් හා යෙදවුම් අඩු ය.
(3) අවදානම හා අඩමානය අඩු ය. (4) ඉහළ තාක්ෂණික දැනුමක් අවශ්‍ය නොවේ.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

[හතරවැනි පිටුව බලන්න.

www.agaram.lk



**32.** එළවළු හා පලතුරුවල පසු අස්වනු හානිය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - වර්තමානයෙහි ශ්‍රී ලංකාවේ පසු අස්වනු හානිය 5% - 10% පමණ වේ.
B - අස්වනු බොහෝ වේලාවක් ගොඩගසා තිබීමෙන්, පසු අස්වනු හානිය වැඩි වේ.
C - අස්වනු තේරීමෙන් හා ශ්‍රේණිගත කිරීමෙන්, පසු අස්වනු හානිය අඩු වේ.
මෙයින් නිවැරදි ප්‍රකාශ වනුයේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි.
(3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.

**33.** වැටි හා කාණු පාත්තිවල සිටුවීමට නිර්දේශිත බෝග වනුයේ,
(1) බතල, ඉන්නල හා රටකජු ය. (2) බටු, මිරිස් හා තක්කාලි ය.
(3) ඉරිඟු, කඟ හා බඩඉරිඟු ය. (4) කැරට්, බීට් හා ලීක්ස් ය.

**34.** සමහර පුද්ගලයින්ට ඇතැම් ආහාර වර්ග අනුභව කිරීමෙන් අසාත්මික තත්ත්ව ඇති වේ. එවැනි ආහාර වනුයේ,
(1) අර්තාපල් හා කිරි අල ය. (2) ඉස්සන් හා තක්කාලි ය.
(3) බටර් හා කිරි ය. (4) පාන් හා බඩඉරිඟු ය.

**35.** දියර කිරි පරිරක්ෂණය නිවැරදිව දක්වා ඇති වරණය කුමක් ද?
(1) දියර කිරි $\xrightarrow{\text{අධි ශීතනය}}$ යෝගට් (2) දියර කිරි $\xrightarrow{\text{සාන්ද්‍ර කිරීම}}$ මුදවාපු කිරි
(3) දියර කිරි $\xrightarrow{\text{විසිරි වියළීම}}$ කිරි පිටි (4) දියර කිරි $\xrightarrow{\text{ජීවාණුහරණය}}$ චීස්

**36.** යල කන්නය හා මහ කන්නය යන කන්න දෙකෙන් ඕනෑම කන්නයක වගා කළ විට නියමිත වයසේ දී ඵල දරන ශාක,
(1) දිගු දින ශාක වේ. (2) කෙටි දින ශාක වේ.
(3) දින උදාසීන ශාක වේ. (4) ප්‍රභා අවධි සංවේදී ශාක වේ.

**37.** පහත සඳහන් එළ ගව වර්ග අතරින් මනා පාලනයක් යටතේ, වැඩි ම කිරි නිෂ්පාදනයක් ලබා දෙන ගව වර්ගය කුමක් ද?
(1) රතු සින්දි (2) ජර්සි (3) ෆ්‍රීෂියන් (4) සහිවාල්

**38.** ශ්‍රී ලංකාවේ ඇති කරනු ලබන විදේශීය සම්භවයක් සහිත නළල, පාද කෙළවර හා වලිගය කෙළවර සුදු පැහැති මී ගව වර්ගය වනුයේ,
(1) මූරා ය. (2) සූර්ති ය. (3) නිලිරවි ය. (4) අයර්ශයර් ය.

**39.** නිදිබරව එකට ගුලි වී සිටින කුකුළු පැටවුන්ගේ ගුද මාර්ගය අවට සුදු පැහැති මලද්‍රව්‍ය බදාමයක් සේ ඇලී තිබෙනු දක්නට ලැබුණි. මොවුන්ට වැළඳී ඇති රෝගය විය හැක්කේ,
(1) කොක්සිඩියෝසිස් ය. (2) පුල්ලෝරම් ය.
(3) රැනිකට් ය. (4) වටපණු ආසාදනය ය.

**40.** බ්‍රොයිලර් කුකුළන් පාලනයේ දී එක් සතෙකු සඳහා නිර්දේශිත ඉඩ ප්‍රමාණය,
(1) වර්ග අඩි 1/2 කි. (2) වර්ග අඩි 1 කි.
(3) වර්ග අඩි 2 කි. (4) වර්ග අඩි 3 කි.

* *

[පස්වැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**81 | S | I, II**

55343

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2016**

කෘෂි හා ආහාර තාක්ෂණය I, II
விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் I, II
Agriculture and Food Technology I, II

**කෘෂි හා ආහාර තාක්ෂණය II**

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

**1.** ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රධාන ආහාර බෝගය වන 'වී' මගින් මූලික ව ශක්ති අවශ්‍යතාව සපුරා ගැනේ. මනාව සැලසුම් කරන ලද ගෙවත්තක් පවත්වාගෙන යාමෙන් සෙසු ආහාර බෝග නිෂ්පාදනය කළ හැකි අතර පවුලේ සාමාජිකයින්ට සමතුලිත ආහාර වේලක් ද ලබාගත හැකි වේ.

(i) පවුලේ ආහාර වේලට ප්‍රෝටීන් සපයා ගැනීම සඳහා ගෙවත්තේ වගා කළ හැකි බෝග **දෙකක්** නම් කරන්න.

(ii) කුඩා ගෙවත්තක අතුරුයත් ගෑම සඳහා භාවිත කළ හැකි උපකරණ **දෙකක්** නම් කරන්න.

(iii) ගෙවතු වගාවක කෘමි පළිබෝධ පාලනය සඳහා ගෘහස්ථව සකස් කර ගත හැකි රසායනික **නොවන** පළිබෝධනාශක **දෙකක්** සඳහන් කරන්න.

(iv) (a) පාත්ති තවාන් හා සැසඳීමේ දී නෙරිඩෝකෝ තවාන් ක්‍රමයේ ඇති වාසිය කුමක් ද?

(b) නෙරිඩෝකෝ තවාන් මිශ්‍රණය සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා ඒවායේ අනුපාතය ලියන්න.

(v) බෝගයක නයිට්‍රජන් ඌනතාව මගහරවා ගැනීම සඳහා පසට යෙදිය හැකි රසායනික පොහොර වර්ග **දෙකක්** නම් කරන්න.

(vi) පසෙහි ජලවහනය දුර්වල වීම නිසා බෝග වගාවට ඇති විය හැකි **අහිතකර** බලපෑම් **දෙකක්** ලියන්න.

(vii) (a) පාංශු ව්‍යුහය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

(b) ශ්‍රී ලංකාවේ දැකිය හැකි ප්‍රධාන පාංශු ව්‍යුහ **තුනක්** සඳහන් කරන්න.

(viii) පාරම්පරික වී ප්‍රභේද හා සැසඳීමේ දී වැඩි දියුණු කරන ලද වී ප්‍රභේද සතු ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ix) වී වගාවක වල් පැළෑටි ඇති වීම වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි රසායනික **නොවන** ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(x) බිත්තර නිෂ්පාදනය සඳහා ඇති කිරීමට නිර්දේශිත කුකුළු වර්ග **දෙකක්** නම් කරන්න.

**2.** බෝගවලට බලපාන ප්‍රධාන පාරිසරික සාධක දෙක වනුයේ පස සහ දේශගුණයයි. මෙම සාධක දෙක මනා ලෙස කළමනාකරණය කර ගැනීමෙන් සාර්ථක ව බෝග වගා කළ හැකි ය.

(i) (a) බෝග වගාවේ දී පසට කාබනික පොහොර යෙදීමේ වාසි **දෙකක්** ලියන්න.

(b) බෝග සඳහා පසට යොදන රසායනික පොහොරවල කාර්යක්ෂමතාව වැඩි කරගත හැකි ක්‍රම **දෙකක්** ලියන්න.

(ii) කාලගුණය හා දේශගුණය අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) පහත දැක්වෙන්නේ කෘෂි හා ආහාර තාක්ෂණය විෂයය හදාරන ශිෂ්‍යයකුගේ ක්ෂේත්‍ර සටහන් පොතකින් උපුටාගත් අසම්පූර්ණ වගුවකි. එහි A, B, C හා D යන හිස්තැන්වලට අදාළ **තොරතුරු පමණක්** නිවැරදි අක්ෂරය සහිතව ඔබේ පිළිතුරු පත්‍රයෙහි සඳහන් කරන්න.

| දේශගුණික කලාපය | ප්‍රධාන වශයෙන් ලැබෙන මෝසම් වර්ෂාව | එම වර්ෂාව ලැබෙන කාල වකවානුව (මාස) |
|---|---|---|
| තෙත් කලාපය | A .................... | B (.............. සිට ........... දක්වා) |
| වියළි කලාපය | C .................... | D (.............. සිට ........... දක්වා) |

[හයවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk


www.agaram.lk



**3.** ශාක වර්ධක ප්‍රචාරණයේ දී ඇතැම් විට ස්වාභාවික ප්‍රචාරණ ව්‍යුහ යොදා ගැනේ. මේවාට අමතර ව ඇතැම් ශාක ප්‍රචාරණය සඳහා දඬු කැබලි සිටුවීම, බද්ධ කිරීම හා පටක රෝපණය ආදී ශිල්පීය ක්‍රම ද අනුගමනය කරනු ලැබේ.

(i) ස්වාභාවික වර්ධක ප්‍රචාරණ ව්‍යුහ **දෙකක්** නම් කර, ඒවාට උදාහරණය බැගින් සඳහන් කරන්න.
(ii) වායව අතු බැඳීමේ ක්‍රියාවලිය, නම් කරන ලද රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.
(iii) (a) පටක රෝපණය මගින් ශාක ප්‍රචාරණය කිරීමේ වාසි **දෙකක්** ලියන්න.
(b) දඬු කැබලි සිටුවීමේ දී මුල් ඇදීම උත්තේජනය කිරීමට යොදා ගනු ලබන හෝර්මෝන වර්ග **දෙකක්** සඳහන් කරන්න.

**4.** රූප සටහනෙහි දැක්වෙන්නේ ගෘහාශ්‍රිත ව වුව ද සකස් කරගත හැකි සරල නිර්පාංශු වගා ක්‍රමයකි.




(i) (a) මෙම නිර්පාංශු වගා ක්‍රමයේ නම කුමක් ද?
(b) A බඳුන තුළට යොදා ගත හැකි රෝපණ මාධ්‍යයක් නම් කරන්න.
(ii) (a) B ද්‍රාවණයේ ප්‍රයෝජනය කුමක් ද?
(b) B ලෙස යොදා ගත හැකි ද්‍රාවණයට නිදසුන් **දෙකක්** සඳහන් කරන්න.
(iii) (a) නිර්පාංශු වගාවේ වාසි **දෙකක්** සඳහන් කරන්න.
(b) හරිතාගාරයක් තුළ උෂ්ණත්වය ඉහළ යාම පාලනය කිරීමට යොදා ගත හැකි උපක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

**5.** ආහාරයක් නිෂ්පාදනයේ සිට පරිභෝජනය දක්වා ඇති ඕනෑම අවස්ථාවක එය නරක් විය හැකි ය. එබැවින් ආහාර පරිරක්ෂණය කිරීම ඉතා වැදගත් ය.

(i) (a) ආහාර නරක් වීමට හේතු වන භෞතික සාධක **හතරක්** සඳහන් කරන්න.
(b) ආහාර පරිරක්ෂණයේ වැදගත්කම් **දෙකක්** ලියන්න.
(ii) (a) 'ආහාරවල අගය වැඩි කිරීම' යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?
(b) ආහාරවල අගය වැඩි කිරීමේ ක්‍රම **දෙකක්** සඳහන් කර, ඒවාට උදාහරණය බැගින් ලියන්න.
(iii) (a) වෙළෙඳපොළට ඉදිරිපත් කරන ආහාර ඇසුරුමක ලේබලයෙහි අනිවාර්යයෙන් ම ඇතුළත් කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(b) ආහාර ඇසුරුම් කිරීමට භාවිත කරනු ලබන ස්වාභාවික ඇසුරුම් ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

**6.** බෝග අස්වනු නෙළීමෙන් පසු සිදුකරනු ලබන ක්‍රියාකාරකම් පමණක් නොව ක්ෂේත්‍රයේ දී එම බෝගවලට කරනු ලබන පශ්චාත් සාත්තු ද පසු අස්වනු හානිය කෙරෙහි බලපෑම් ඇති කරයි.

(i) අක්‍රමවත් ජල සම්පාදනය ඇතැම් බෝගවල පසු අස්වනු හානියට හේතු වේ. එවැනි අවස්ථා සඳහා නිදසුන් **දෙකක්** ලියන්න.
(ii) (a) නෙළන ලද බෝග අස්වනු පාරිභෝගිකයා අතට පත්වන ක්‍රියාදාමය තුළ පසු අස්වනු හානි සිදු වන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.
(b) එළවළු හා පලතුරුවල පසු අස්වනු හානි සිදු වීම වැලැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** ලියන්න.
(iii) වෙළෙඳපොළෙහි ඇති බාල කරන ලද ඇතැම් ආහාර පරිභෝජනයෙන් මිනිසාට ඇති විය හැකි සෞඛ්‍ය ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

**7.** ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් ඇති කරනු ලබන ගොවිපොළ සතුන් වනුයේ ගවයන් හා කුකුළන් ය.

(i) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාව තුළ හඳුනාගෙන ඇති ගව පාලන කලාප හය අතරින් **හතරක්** සඳහන් කරන්න.
(ii) ගව දෙනක විසින් පෙන්නුම් කරනු ලබන මද ලක්ෂණ **තුනක්** ලියන්න.
(iii) බෘඩරයක් තුළ කුකුළු පැටවුන් විසිරී සිටින ආකාරය අනුව එහි උෂ්ණත්වය පිළිබඳව අදහසක් ගත හැකි ය. ප්‍රශස්ත, අඩු හා වැඩි උෂ්ණත්ව පවතින විට බිම් බෘඩරයක් තුළ කුකුළු පැටවුන් විසිරී සිටින ආකාරය රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

* * *

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk